Department of Education, Sabaragamuwa Province/ Weekly School

# නාට්‍ය පෙළ රස විඳිමු

නාට්‍ය පෙළක් රචනා කිරීමට හා ඉන් නාට්‍ය පෙළක් නිෂ්පාදනයක් බවට පත්කිරීමට පෙර ඔබ අනිවාර්යයෙන් වේදිකාගත වී ඇති රසවත් නාට්‍යයක පෙළ රචනයක් කියවා තිබිය යුතුය. ඉන් ඔබට මනා අවබෝධයක් ලබා ගත හැකිය. ඔබ සතුව ඇති ළමා නාට්‍ය පිටපතක් කියවා බලන්න.

උදා : පුංචි අපට දැන් තේරෙයි

අමර ගියා දිව්‍ය ලෝකේ

නාට්‍ය පෙළක් කියවීමේ දී පහත කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

- පෙළ පැහැදිලිව හා අර්ථවත්ව කියවීම
- ගැමි පරිසරයට අදාළ නාට්‍යක් නම් ගැමි ශෛලියට අනුරූප තාලයක් සංවාද සඳහා භාවිත කිරීම.
- එහි නාට්‍යමය අවස්ථා ප්‍රකාශ කරන ආකාරය
- එහි අන්තර්ගත චරිතවල ස්වාභාවය කෙරෙහි
- එම නාට්‍ය පෙළ තුළින් ජීවිතයට ගත හැකි පණිවිඩ පිළිබඳ

සාමාන්‍ය අන්දමින් කතන්දරයක් කියවන ආකාරයෙන් නොව රංගන ශිල්පියෙක් වේදිකාවේ රංගනයේ යෙදෙන අවස්ථාවේ සංවාද හසුරුවන ආකාරයට ඔබ පෙළ හැසිරවිය යුතුය. ආදාළ සංවාද තාලානුකූලව කියවීම මගින් එකී චරිත ස්වාභාවය වටහා ගත හැකිය. නාට්‍යමය අවස්ථා හඳුනාගත හැකිය.

පැවරුම : පාලිත ලොකුපෝතාගම මහතා ගේ "අමර ගියා දිව්‍ය ලෝකේ" ළමා නාට්‍ය පෙළ කියවන්න.

